ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 2023/2024
4 වන මට්ටම
අවසන් පරීක්ෂණය
**LLU4609 – පවුල් නීතිය**
කාලය පැය 03 යි

දිනය : 2025 මැයි 26 කාලය : ප.ව. 1.30 - ප.ව. 4.30

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

මුළු ප්‍රශ්න ගණන 08 යි.

**ප්‍රශ්න අංක** 01 ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ඔබ විසින් තෝරා ගනු ලබන ප්‍රශ්නවලට අදාළ පිළිතුරු විනිශ්චිත නඩු තීරණ හා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් ඉදිරිපත් කළ යුතුය.**

**අ කොටස - පහත සඳහන් අනිවාර්ය ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.**

**01.** ධනවත් ව්‍යාපාරිකයෙකු වන අභිමාන් එංගලන්තයේ සහ කැනඩාවේ සමාගම් කිහිපයක් හිමිකරුවෙකි. ඔහු රනුලි සමඟ විවාහ වී වසර 27 ක් ගත වී ඇති අතර වයස අවුරුදු 16 ක් වන දැනට පාසල් යන ඈන්; වයස අවුරුදු 22 ක් වන විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන ඈන්ටන්; සහ ඔවුන්ගේ වැඩිමහල් දරුවා වන පූර්ණ ආබාධිත තත්වයේ පසුවන වයස අවුරුදු 26 ක් වන නීටා වශයෙන් ඔවුන්ට දරුවන් තිදෙනෙක් සිටී. අභිමාන් පසුගිය වසර කිහිපය තුළ කොළඹ සේවය කරන ලද අතර නිවසේ වියදම් සඳහා නිතිපතා රනුලි වෙත මුදල් යැවීමට පුරුදුව සිටියේය. කෙසේ වෙතත්, පසුගිය වසර තුළ, ඔහු කිසිදු මූල්‍ය ආධාරයක් ලබා දීම නවතා දමා ඇත. ගෘහණියක් වන රනුලි දැන් දරුවන්ගේ සහ ඇයගේ දෛනික වියදම් කළමනාකරණය කිරීමට බලවත් අරගලයක් කරමින් සිටී. ඇයට අසල ඇති කඩයකින් ණයට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමට සිදු වී ඇත. ඇය නැවත මුදල් ලබා දෙන ලෙස අභිමාන්ගෙන් ඉල්ලා සිටි විට, ඔහු එය ප්‍රතික්ෂේප කළේය. ඒ වෙනුවට ඇයට ඇගේ දෙමාපියන්ගේ නිවසට ගොස් , දරුවන් ඔවුන්ගේ රැකවරණය යටතේ තබා රැකියාවකට යන ලෙස යෝජනා කළේය. අභිමාන්ට අයත් නුවරඑළියේ පිහිටි වෛවාහක නිවසින් පිටවීම ද රනුලි තරයේ ප්‍රතික්ෂේප කර ඇත.

මේ අතර, අභිමාන්ගේ මව වන 75 හැවිරිදි සහ වයෝවෘධ සෝමා, මහනුවර පිහිටි පවුලේ නිවසේ තනිවම ජීවත් වේ. ඇය ජීවත් වන්නේ සුළු විශ්‍රාම වැටුපක් සහ අසල්වැසියන්ගෙන් ඉඳහිට ලැබෙන ආධාර මතය. ඇය අභිමාන්ගෙන් නැවත නැවතත් මූල්‍යමය උපකාර ඉල්ලා සිටියද, ඔහු තම මවගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර නොදැක්වීය.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ පවතින නීති රාමුව යටතේ රනුලි, ඇගේ දරුවන්ට සහ සෝමාට අභිමාන්ගෙන් කවර සහන ඉල්ලා සිටිය හැකිද යන්න විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

## ආ කොටස - මෙම කොටසේ ඇති ඕනෑම ප්‍රශ්න හතරකට (4) පිළිතුරු සපයන්න. 00239

**02.** දී ඇති නිදර්ශනය සැලකිල්ලට ගනිමින් පහත අවස්ථාවන්හි නීතිමය තත්ත්වය කෙටියෙන් සාකච්ඡා කරන්න. **සෑම කොටසක්ම වෙනම අවස්ථාවක් වන අතර එක් එක් කොටස අතර කිසිදු සම්බන්ධයක් නොමැත.**

| |
|---|
| ඉඩමේ නම: පොල් වත්ත<br>ප්‍රමාණය: අක්කර 4 |

A = ස්වාමිපුරුෂයා

B = බිරිඳ

X = දුව

Y = පුතා

**i.** සාමාන්‍ය නීතියෙන් පාලනය වන පොල් වත්තේ හිමිකරු වන "A" , 2024 දී අන්තිම කැමති පත්‍රයක් නොමැතිව මිය ගියේය. පොල් වත්තට "B", "X" සහ "Y" යන අය සතු අයිතිවාසිකම් සාකච්ඡා කරන්න.

**ii.** සාමාන්‍ය නීතියෙන් පාලනය වන පොල් වත්තේ හිමිකරු වන "A" විසින් "B", "X" සහ "Y" බැහැර කොට පොල් වත්ත අන්තිම කැමති පත්‍රයක් මගින් පුණ්‍යායතනයකට පවරා ඇත. අන්තිම කැමති පත්‍රයේ වලංගුභාවය සාකච්ඡා කරන්න.

**iii.** 2015 දී උඩරට නීතිය යටතේ දීග හි විවාහකට එළඹුනු "X", 2017 දී පොල් වත්තේ ඇගේ මුල්ගෙදර වෙත ආපසු ගියාය. "A" සහ "B" 2024 දී මෝටර් රථ අනතුරකින් මිය ගියහ. පොල් වත්තේ උරුමකරුවන් කවුදැයි සාකච්ඡා කරන්න.

**iv.** "Y" යනු "A" සහ "B" ගේ දරුකමට හදාගත් දරුවෙකි. 2020 දී, "A" සහ "B" මෝටර් රථ අනතුරකින් අන්තිම කැමති පත්‍රයක් නොමැතිව මිය ගියහ. සියලුම පාර්ශවයන් මුස්ලිම් නීතියෙන් පාලනය වන බව උපකල්පනය කරමින් පොල් වත්තට "X" සහ "Y" සතු අයිතිවාසිකම් සාකච්ඡා කරන්න.

**v.** තේසවලමෙයි නීතියෙන් පාලනය වන "A" සහ "B" ඔවුන්ගේ 5 වන විවාහ සංවත්සරය යෙදී තිබූ 2018 වර්ශයේ දී දෙදෙනාම එක්ව පොල් වත්ත මිලදී ගත්හ. 2024 දී "A" ගේ මරණයෙන් පසුව "B" ඇගේ සහෝදරියට එම ඉඩම තෑගි කළාය. තෑග්ගේ වලංගුභාවය සාකච්ඡා කරන්න.

(ලකුණු 04 x 5 = ලකුණු 20)

**03.** වලංගු විවාහයක් තුළ උපත ලබන දරුවෙකුට සුජාතභාවය පිළබඳ පූර්ව නිගමනය යෙදීම හරහා ශ්‍රී ලංකා නීතිය පීතෘත්වය පිළිබඳ ගැටලුවට මුහුණ දෙන ආකාරය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න. ඔබේ පිළිතුර මගින් අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන, නඩු නීතිය සහ පූර්ව නිගමනය බැහැර කිරීම සඳහා වත්මන් අධිකරණ ප්‍රවේශය විභාග කරන්න. එසේම, නවීන විද්‍යාත්මක වර්ධනයන් සැලකිල්ලට ගනිමින් මෙම උපකල්පනයේ අදාළත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

**04.** සාමාන්‍ය නීතිය, උඩරට නීතිය සහ මුස්ලිම් නීතිය යටතේ දික්කසාදය පාලනය කරන නීතිමය රාමුව සසඳන්න. ඔබේ පිළිතුර මගින් වරද සහ යථා තත්වයට පත් කළ නොහැකි විවාහය කඩාලප්පල් වීම යන සංකල්ප කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

(ලකුණු 20)

**05.** යාපනයේ උපන් අරුන්, 2010 දී කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයට ඇතුළත් වූයේය. විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන කාලය තුළ, ඔහු වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය ලබන දෙමළ ශිෂ්‍යාවක් වන මීනා සමඟ සමීප සම්බන්ධතාවයක් ගොඩනඟා ගත්තේය. ඔවුන්ගේ සබඳතාවය වර්ධනය වුවද, මීනාගේ පවුල කුල හා සංස්කෘතික වෙනස්කම් හේතුවෙන් එම සබඳතාවයට අකමැති විය.

2017 දී, මූල්‍ය නිලධාරියෙකු ලෙස මඩකලපුවේ රැකියාවක් ලබා ගැනීමෙන් පසු, අරුන් ස්ථිරවම එහි පදිංචියට ගියේය. එසේම, මීනාද මඩකලපුවේ මහ රෝහලේ වෛද්‍ය නිලධාරිනියක් ලෙස ද පත් කරන ලදී. මීනාගේ දෙමව්පියන්ගේ අනුදැනුමකින් හෝ කැමැත්තකින් තොරව, යාපනයේ අරුන්ගේ පවුලේ නිවසේ සාම්ප්‍රදායික තාලි උත්සවයක් පැවැත්වීමෙන් අරුන් සහ මීනා ඔවුන්ගේ විවාහය සැමරීමට තීරණය කළහ. විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ විවාහය විධිමත් ලෙස ලියාපදිංචි කිරීමක් සිදු නොකළද, පසුව යුවළ ස්වාමිපුරුෂයා සහ භාර්යාව ලෙස එකට ජීවත් වූහ. 2019 දී මීනා පුතෙකු බිහි කළාය.

ඉහත අවස්ථාව සලකා බලා පහත ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න, ඔබේ පිළිතුරු සඳහා හේතු දක්වන්න.

**i.** අරුන් සහ මීනා අතර වලංගු විවාහයක් පවතින්නේද? (ලකුණු 10)

**ii.** සියලුම පාර්ශවයන් උඩරට නීතියෙන් පාලනය වුවහොත් සහ යුවළ සාම්ප්‍රදායික පෝරුව චාරිත්‍ර පවත්වා ඔවුන්ගේ විවාහ සිදුකර තිබේ නම් ඔබේ පිළිතුර වෙනස් වේද? (ලකුණු 05)

**iii.** ඉහත විවාහය 1987 දී සිදු වූ බව උපකල්පනය කරන්න. එම විවාහය පවතිද්දීම අරුන් ඉස්ලාම් ආගම වැළඳගෙන 1990 දී මුස්ලිම් කාන්තාවක් වන සෆානා සමඟ විවාහ වූයේ නම් දෙවන විවාහය වලංගු වේද?

(ලකුණු 05)

**06.** ප්‍රකාශ් සහ නිකිනි යනු තම දියණිය මිනුරි සමඟ කොළඹ මහල් නිවාසයක ජීවත් වූ විවාහක යුවළකි. 2022 දී, ප්‍රකාශ් මධ්‍යම රාත්‍රියේ බීමතින් නිවසට පැමිණීමට පටන් ගත්තාය. එසේ කිරීම නවත්වන ලෙස නිකිනි නැවත නැවතත් ඔහුගෙන් අයැද සිටියද, ප්‍රකාශ් මෙම හැසිරීම දිගටම කරගෙන ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 දී නිකිනි, මිනුරි සමඟ වෛවාහක නිවසින් පිටව නිකිනිගේ සහෝදරිය වන කුමාරි ද ජීවත් වූ ගාල්ලේ ඇගේ දෙමාපියන්ගේ නිවසට ගියාය.

ගාල්ලේ සිටියදී, මිනුරි පෙර පාසලකට ඇතුළත් කරන ලද අතර, නිකිනි ඇඟලුම් කම්හලක රැකියාවක් සොයා ගත්තාය. ඇගේ රැකියාවේ ස්වභාවය අනුව, විශේෂයෙන් රාත්‍රී වැඩ මුර ද තිබුන නිසා, මිනුරිගේ පෙර පාසලේ ගුරුවරියක් ද වන කුමාරි, මිනුරි රැකබලා ගැනීමට නිකිනිට උදව් කළාය.

2024 දී මිනුරිගේ සිව්වන උපන්දිනයේදී, ප්‍රකාශ් නිකිනි අමතා දරුවාගේ භාරකාරත්වය ඉල්ලා සිටියේය. නිකිනි එය තරයේ ප්‍රතික්ෂේප කළාය. පසුව, ප්‍රකාශ් භාරකාර නියෝගයක් ඉල්ලා නීතිමය කටයුතු ආරම්භ කළේය. කෙසේ වෙතත්, නීතිමය කටයුතු අතරතුර, නිකිනි හදිසියේම මිය ගිය අතර, කුමාරි මිනුරිගේ සම්පූර්ණ රැකවරණය භාර ගත්තාය.

දැන් මිනුරිව කොළඹ ප්‍රකාශ්ගේ රැකවරණයට නැවත ගෙන ගියහොත් එය මිනුරිගේ යහපැවැත්මට අහිතකර බව පවසමින් කුමාරි, මිනුරිගේ භාරකාරත්වය නීත්‍යානුකූලව ලබා ගැනීමට කැමත්ත දක්වයි. ප්‍රකාශ් අවධාරනය කරන්නේ, දැනට ජීවතුන් අතර සිටින දෙමව්පියෙකු ලෙස, මිනුරිගේ භාරකාරත්වය සඳහා ඔහුට වැඩි අයිතියක් ඇති බවයි.

ඉහත ගැටලුව විවේචනාත්මකව සාකච්ඡා කරන්න. දෙමාපියන් අතර සහ දෙමාපියන් හා තෙවන පාර්ශවයන් අතර පැනනගින භාරකාරත්ව ආරවුල් ශ්‍රී ලංකා අධිකරණ විසඳන ආකාරය කෙරෙහි අවධානය යොමු කරන්න. (ලකුණු 20)

**07.** (i) කොළඹ ජීවත් වන ශ්‍රී ලාංකික පුරවැසියන් වන ටානිෂා සහ ඔෂාන්, 2009 දී විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ඔවුන්ගේ විවාහය ලියාපදිංචි කළහ. දරු පිළිසිඳ ගැනීම් ප්‍රතිකාර සඳහා අසාර්ථක උත්සාහයන් කිහිපයකින් පසුව, ඔවුන් දරුවෙකු දරුකමට හදාගැනීමට තීරණය කළහ. මොනරාගල ග්‍රාමීය රෝහලක හෙදියක් ලෙස සේවය කරන ටානිෂාගේ ඥාති සහෝදරයා, මල්කි නම් අලුත උපන් බිළිඳෙකු ගැන ඇයට දැනුම් දුන් අතර, ඇගේ ස්වභාවික මව, නව යොවුන් වියේ තනි මාපියෙකු වන අතර, දරුවා මූල්‍යමය වශයෙන් හෝ නිසි අයුරින් රැකබලා ගැනීමට ඇති නොහැකියාව හේතුවෙන් දරුවා දරුකමට හදා ගැනීම සඳහා ලබා දීමට කැමැත්තෙන් සිටියාය.

ටානිෂා සහ ඔෂාන් ස්වභාවික මව හමුවූ අතර, ඇය තම දරුවා දරුකමට හදා ගැනීම සඳහා ඔවුන්ට දීමට එකඟ විය. ඔවුන් දරුවා කොළඹට ගෙනැවිත් ඇයව රැකබලා ගැනීමට පටන් ගත්හ. ඔවුන් කිසිඳු විධිමත් දරුකමට හදා ගැනීමේ ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකළ අතර ඇයව ඔවුන්ගේ දියණිය ලෙස හඳුන්වමින් දරුවා ඔවුන්ගේ පවුලේ නමින් පෙර පාසලකට ඇතුළත් කරන ලදී.

මෙය වලංගු දරුකමට හදා ගැනීමක්ද යන්න සහ එසේ නොවේ නම්, ශ්‍රී ලංකා නීතිය යටතේ මල[illegible] නීත්‍යානුකූලව දරුකමට හදා ගැනීමට ඔවුන් අනුගමනය කළ යුතු නීතිමය ක්‍රියා පටිපාටිය කුමක්ද යන්න පිළිබඳව අවධානය යොමු කරමින් ටානිෂා, ඔෂාන් සහ දරුවා සම්බන්ධ වත්මන් නීතිමය වලංගුභාවය සාකච්ඡා කරන්න. **(ලකුණු 10)**

**(ii)** ඩිලන් උපතින් ටික කලකට පසු අතහැර දමා ගොස් ඇති බිළිඳෙක් වන අතර දැනට ශ්‍රී ලංකාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ රැකවරණය සහ භාරකාරත්වය යටතේ සිටී. දරුවාට ඔහුව රැකබලා ගැනීමට කැමති හෝ හැකියාව ඇති ඥාතීන් නොමැත.

එලිසබෙත් සහ පීටර්, ඔවුන්ගේම දරුවන් ලැබීමට නොහැකි ඕස්ට්‍රේලියානු විවාහක යුවළක් වන අතර ඩිලන්ව දරුකමට හදා ගැනීමට කැමතිය.

ඩිලන්ව දරුකමට හදා ගැනීම සඳහා දරුවන් දරුකමට හදාගැනීමේ ආඥා පනත යටතේ ඔවුන් සපුරාලිය යුතු අවශ්‍යතා පිළිබඳව උපදෙස් දෙන්න.

**(ලකුණු 10)**

**08.** පහත මාතෘකා වලින් ඕනෑම **දෙකක් (2)** තෝරාගෙන ඒ පිළිබඳ සටහන් ලියන්න.

- **i.** ශූන්‍ය විවාහ
- **ii.** විවාහයේ නව ප්‍රවනතා
- **iii.** දැවැද්ද පිළිබඳ බිරිඳගේ අයිතිවාසිකම්
- **iv.** බාලවයස්කාරයෙකුගේ දේපළ පරිපාලනය කිරීමේ අයිතිය

**(ලකුණු 10 x 2 = ලකුණු 20)**

**** *සියළුම හිමිකම් ඇවිරිණි* ****